055288
ML/PR
2017/09/0

# ගඟබඩ පත්තුවේ දේව ඇදහිලි හා විශ්වාස

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලබන ප්‍රාසංගික කලාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය යි.

එස්. ඒ. ඒ. ඩී. යමුනා නිශාන්ති පීරිස්

DD/MP/DA/09/022

2014

055288

නර්තන හා නාට්‍ය කලා පීඨය

පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# හැඳින්වීම

දෙවියන් පිළිබඳ ''විශ්වාසය'' ප්‍රාග් බෞද්ධ යුගය තෙක් අතීතයට ගමන් කරනු ලබන බව පෙනේ. ප්‍රාථමික සමාජයන් හි දේව සංකල්පය හුදු ඇදහීමක් පමණක් ම නොවීය. එය ස්වභාව ධර්මයේ විවිධ විපර්යාසයන් හමුවේ නොසැලී සිටීමට නොහැකි වූ ජනයා තුළ නිරායාසයෙන් ම හටගත් විශ්වාසයක් විය. එසේ වුව ද මානව සමාජයේ වර්ධනයත් සමඟ මානවයාගේ චින්තන ශක්තියෙහි ඇති වූ පුළුල්භාවය තුළ කිසියම් හැඟීම් සමුදායක් මත පදනම් ව දෙවියන් ඇදහීම සිදු කළ බව පෙනේ. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ ලංකාවට බුද්ධාගම හඳුන්වාදීමත් සමඟ සංවිධානාත්මක ලෙස ගොඩනැගුණ බෞද්ධ ජන සමාජයෙන් වුව ද දෙවියන් පිළිබඳ සංකල්පය ඉවත් නොවූයේ උක්ත තත්ත්වය නිසා වන්නට ඇත. මේ අනුව ලාංකේය ජන සමාජය තුළ විටින්විට ඇති වූ චලනයන් හමුවේ ද නොවැදගත් ලෙස යටපත් නොවූ මෙම දෙවියන් පිළිබඳ සංකල්පය ක්‍රමයෙන් වැඩෙන්නට විය. මේ තත්ත්වය තුළ ඒ ඒ ප්‍රදේශවලට විවිධ වූ දෙවිවරුන් පිළිබඳ සංකල්පයන් අන්තර්ග්‍රහණය වෙමින් විකාශනය වී ඇති අතර එකී තත්ත්වය සියනෑ කෝරළයේ ගඟබඩ පත්තුවෙහි ක්‍රියාත්මක වී ඇති ආකාරය පිළිබඳ ගවේෂණයක යෙදෙනු වස් ''ගඟබඩ පත්තුවේ දේව ඇදහිලි හා විශ්වාස'' මැයෙන් අප මෙම පර්යේෂණයට පිවිසෙන ලදි.

මෙහි පළමුවන පරිච්ඡේදය සියනෑ කෝරළයේ ගඟබඩ පත්තුව පිළිබඳ භූ ගෝලීය වූ ද ස්වභාවික වූ ද විවිධත්වය සහ ඓතිහාසික ප්‍රාදේශීය නිර්ණයන් සහ ඉංගම් ආදිය දක්වෙන අතර ග්‍රාමීය වටපිටාවකින් යුතු එම ප්‍රදේශයේ ජනතාවගේ ස්වභාවික සම්පත් ආශ්‍රිත ජීවන වෘත්තීන් හා දේව සංකල්පයන් අතර සම්බන්ධතාව කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

ඇදහිලි විශ්වාසෙහි ප්‍රභවය හා ලංකාවේ දේව සංකල්පයේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු ගොනු කිරීම දෙවන පරිච්ඡේදය යටතේ සිදු කළෙමු. එහි දී මුල් අවධියේ දෙවියන් ඇදහීම පිළිබඳ තොරතුරුත්, සමාජ පරිණාමය හා දේශපාලන වෙනස්වීම් මත

යුගකරණයට ලක්ව ඇති ලංකා ඉතිහාසය තුළ ඒ ඒ යුගයන්හි දී දේව සංකල්පය ඉස්මතු වීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, ගම්පොළ, කෝට්ටේ, මහනුවර අවධීන් තුළ ලංකාවේ දේව සංකල්පයේ වර්ධනය හා දේශපාලන, සමාජ වෙනස්වීම් නිසා සිදු වූ උච්චාවචනයන් පිළිබඳ වත් විග්‍රහ කරමින් දේව සංකල්පයේ විකාශනය පිළිබඳ කරුණු මෙහිලා සාකච්ඡා කළෙමු.

මේ අනුව ලංකාවේ මුල් බැසගෙන තිබූ දේව සංකල්පයන් ගඟබඩ පත්තුවේ ජනයාගේ දේව ඇදහිලි හා විශ්වාස කෙරෙහි බලපා ඇත්තේ කෙසේ ද යන්න මෙහි තුන්වන පරිච්ඡේදයේ විමසීමට ලක් කළෙමු. ඒ වූ කලී පොදුවේ සමස්ත ශ්‍රී ලාංකීය ඇදහිලි ධාරාවේ පවත්නා හේතුවෙන් ගඟබඩ පත්තුවට ද බලපෑ කතරගම දෙවියන්ගේ සිට ලක්ෂ්මී දේවිය දක්වා වූ ප්‍රමුඛ ඇදහිලි පිළිබඳ තොරතුරු ය.

සිවුවන පරිච්ඡේදය ගඟබඩ පත්තුවේ ප්‍රාදේශීය දේව ඇදහිලි හා විශ්වාස පිළිබඳ කරුණු එකතුවකි. මෙහි විශේෂ වශයෙන් ම සුදුමල් බණ්ඩාර දේව විශ්වාසය සහ රංවල දේව විශ්වාසය ආදිය සවිස්තර කෙරේ.

පස්වන පරිච්ඡේදය තුළ කියැවෙනුයේ උක්ත විශ්වාසයන් සහ ඇදහිලි, වත්මන් ප්‍රජාව තුළ ක්‍රියාත්මක වන ආකාරය සහ ඒ පිළිබඳ විවිධ පැතිකඩ දෘෂ්ටීන් ඔස්සේ කරන ලද විමසා බැලීමකි.